# නව සංවර්ධන රටා සොයා ගනිමු

## දකුණු ආසියා අවශ්‍යතා අගමැතිතුමා කියයි

යටත් විජිත පාලකයන් ගෙන් උරුම වූ සංවර්ධන ආදර්ශ වෙනුවට දකුණු ආසියා කලාපයේ රටවලට වඩාත් හොඳින් ගැලපෙන සංවර්ධන ආදර්ශ සොයා ගැනීමේ ලොකු අවශ්‍යතාවක් දැන් මෙම කලාපය තුළ උද්ගතව ඇතැයිද ස්වශක්තිය කෙරෙහි විශ්වාසය තැබීම ජනතා සහභාගිත්වය සහ දේශීය හා ප්‍රාදේශීය සම්පත් උපයෝගී කර ගැනීම ආදී ප්‍රතිපත්ති මත මෙම නව සංවර්ධන ආදර්ශ පදනම් විය යුතු යැයිද ආර්. ප්‍රේමදාස අග්‍රාමාත්‍යතුමා ඊයේ පැවසීය.

අගමැතිතුමා එසේ කීවේ කොළඹ බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේදී ඊයේ ආරම්භ වූ දකුණු ආසියා සහයෝගිතා පරිසර වැඩ සටහනේ (සකෙප්) ප්‍රථම පාලක මණ්ඩල රැස්වීමේ ආරම්භක දේශනය පවත්වමිනි.

එහිදී තවදුරටත් කතාකළ අග්‍රාමාත්‍ය ආර්. ප්‍රේමදාස මහතා අප ජීවත්වන ප්‍රදේශයේ පරිසරය කළමනාකරණය කිරීමේ අභියෝගයට මුහුණ දීමට සහයෝගයෙන් ක්‍රියා කිරීමේ අවශ්‍යතාව මෙම සකෙප් සංවිධානය පිහිටුවන අවස්ථාවේ පිළිබිඹු වූ බවත් අද මෙම සමුළුවේ එම සහයෝගය ප්‍රයත්න තවදුරටත් තහවුරු වන බවත් කීවේය.

පිටරට යවා ආදායම් ලබන අමු ද්‍රව්‍ය වලට හා නිෂ්පාදිත භාණ්ඩවලට විදේශීය රටවල ඇති ඉල්ලුම පහත වැටීමත් උද්ගත වන බැරෑරුම් ප්‍රශ්නවලට මුහුණ දී සිටින අපට විශේෂයෙන්ම අප වැනි අසල්වැසි රටවල් අතර සහයෝගිතාවක් ඇතිකර ගැනීම හා එකිනෙකාට පිහිටවීමේ වැඩ පිළිවෙළක් ඇතිකිරීම වැදගත් වන්නේ යැයි කී අගමැතිතුමා මේ අනුව දකුණු ආසියා සහයෝගිතා පරිසර වැඩ සටහන ඇරඹීම ඉතාම වැදගත් පියවරක් ලෙස පිළිගැනීමට හැකි යයි කීවේය.

සහයෝගිතාව සඳහා කිසිම වැඩ පිළිවෙළක් හෝ සංවිධානයක් හෝ නොතිබූ කාලයක, දකුණු ආසියා ප්‍රදේශයේ අප රටවල් එකතු වී එවන් සංවිධානයක් ඇති කර ගැනීමට හැකි වීම 1981 වසරේදී අප ලැබූ [illegible] බවද අගමැතිතුමා කීවේය.

අප අපම සට්ගිය කර ගත් සහයෝගිතාවට අවශ්‍ය පදනම [illegible] ගැනීමත් එය සාර්ථකව පවත්වාගෙන යාමට අවශ්‍ය විශේෂ මට ආයතන වීමට [illegible] නැතිව තීරණය කිරීමත් මෙම සකෙප් සංවිධානයේ වැදගත් කමක් බව කී අගමැතිතුමා මීට අයත් රටවල් අතරින් සමහර රටවල් අත්‍යාවශ්‍ය ආර්ථික සහයෝගිතාව ඇතිකර ගැනීමට අදහස් කර ඇති බැවින් මෙම සංවිධානය එම අදහස් ක්‍රියාත්මක කිරීමට නගය විය යුතු යයිද පැවසීය.

අගමැතිතුමා මෙසේද පැවසීය.

අපගේ වර්තමාන මෙන්ම අනාගත පැවැත්මට පදනම වන්නේ පරිසරයයි. එහි ආරක්ෂාවට [illegible] ලබන ශ්‍රී මාර්ග වලින් දකුණු ආසියාවේ පළමුවන සහයෝගිතා ප්‍රයත්නයට මුල පිරීම ඉතාම උචිත යයි මා කල්පනා කරනවා. මෙම ප්‍රගතිගාමී ප්‍රයත්නය සම්බන්ධයෙන් දකුණු ආසියාවේ ජාතීන්ගේ දේශපාලන නායකත්වයන්ට මගේ අවංක ප්‍රශංසාව පළ කරන්නට කැමතියි.

### මුක්ති මග

සංවර්ධනයත්, සංවර්ධන ක්‍රියාවලියත් ප්‍රධාන වශයෙන් රඳා පවතින්නේ පරිසරය ශක්තිමත් කර ගැනීමට ගසා මුක්ති මග බව අප හොඳාකාර අවබෝධ කර ගෙන තිබෙනවා. අප පරිසරය තහවුරු කර ගැනීම සඳහා මෙම මුක්ති, අප විසින්ම ශක්තිමත් කරගත යුතුයි. වර්තමානයේ මෙන්ම අනාගත සංවර්ධනය පවත්වා ගත හැකි බවට සැකසීම අප විසින් දැන්ම ඉදිරිපත් කළ යුතුව තිබෙනවා. එසේම නොසංසුන් ආර්ථික අවුල් වියවුල් අස සම්පූර්ණ ආර්ථික නිදහසට හා විනාශයන් ඉදිරි කාලයේ ප්‍රධාන ලක්ෂණයන් වන්ට පුළුවන්.

වැඩිකල් නොගොස් ලෝකයේ ජනගහනය කෝටි හයසියය ඉක්මවා යනවා. මෙයින් කෝටි 150 ක් පමණ දකුණු ආසියා කලාපය තුළ වෙසෙන්නන් වෙයි. එයින් වැඩි පිරිසක් දිළිඳු ජනතාව අතරට වැටෙනවා. දැනටමත් තදබල ආකාරයට පීඩිත තුබෙන පරිසරය හා ස්වභාවික සම්පත් කෙරේ එම ජනතාව ගෙන් තදබල බලපෑමක් ඇති වීමද නියතයයි. මෙහි ප්‍රතිඵලය ලෙසට කැලෑ විනාශය, මතුපිට පස සෝදා පාළුවීම, වැනි විපාක උද්ගතවනු අපට දකින්නට ලැබේ.

එසේම නාගරික පරිසරය පැතිරීම, පරිසර දූෂණය, ජල හිඟය සතුන් විසින් තණ බිම අධික ලෙස උරා කෑම, ජලාශවල හිමාම ත් ඔවා මසුන් මැරීම, විෂ සහිත අපවිත්‍ර ද්‍රව්‍ය පැතිරීම යනාදී අහිතකර ලක්ෂණයන් අපට වැඩි වැඩියෙන් දක්නට ලැබෙනවා. ඇත එබඳු ලොවක එකම අර්ථවත් සංවර්ධනය වන්නේ අවම ප්‍රමාණයක් මූලික අවශ්‍යතාවන් පිරිමැසීමට සමත්වන හා මෙරට දෙන ස්වභාවයේ සංවර්ධනයයි. එබඳු පරිසරයේ ආරක්ෂාව ඇති කිරීමේ හා මෙරට දෙන සංවර්ධනයක් ඇති කිරීමේ අරමුණ මා මේ ප්‍රථම පාලක මණ්ඩල රැස්වීම හමුවේ තබනවා.

දකුණු ආසියා කලාපයේ ඉතාම කැපී පෙනෙන යථාර්ථය නම් අධික ජනගහනයයි. මේ ජනගහනය දිළිඳු බවත් නැති ඉතාමත් සීමිත ඉඩකඩම් ප්‍රමාණයකට කොටු වී සිටිනවා. මුලුන් වෙනුවෙන් කලාපයේ සීමිත සම්පත් වලින් උපරිම ප්‍රයෝජන ලබා ගැනීම සඳහා සූක්ෂම ලෙසින් තුළනය කළ සංවර්ධනයක් කළ යුතුව තිබෙනවා.

මෙම අරමුණ ඉටු කර ගැනීම සඳහා ඇතැම් විට අප පිටරටින් කොපිකර ගෙන තිබෙන යටත් විජිත පාලකයන්ගේ සංවර්ධන ආදර්ශ අතහැර දමන්න සිදු වන්ට පුළුවන්. එනිසා කාලීන විශයෙන් හැකියාව ගත හැකි සංවර්ධන ආදර්ශ සොයා ගැනීමේ ලොකු අවශ්‍යතාවක් දැන් ඇති තුළ තිබෙනවා.

### ස්වශක්තිය

ස්වශක්තිය කෙරේ විශ්වාසය තැබීම, ජනතා සහභාගිත්වය දේශීය හා ප්‍රාදේශීය සම්පත් උපයෝගී කර ගැනීම ආදී ප්‍රතිපත්ති මත අප නව ආදර්ශ පදනම් කර ගන්ට ඕනෑ. අපගේ රටවල දැනට ප්‍රචලිතව තිබෙන සංවර්ධන රටාවන් හා ජීවන ශෛලීන් අවශ්‍ය ලෙසින් සංශෝධනය කිරීමේ කට ප්‍රජා ලබන වසර කිහිපය තුළදී සකෙප් සංවිධානයේ අවධානය යොමුවනවා දක්නට මම කැමතියි. ජාති සර්ව විශයෙන් බලන විට ගැබ්වන්නා වන්නාවූත් සමාජ ආර්ථික විශයෙන් උචිත වන්නාවූත් සංවර්ධන රටාවක් බිහි කර ගැනීමට උනන්දුවක් මින් ඇතිවේ යැයි මා විශ්වාස කරනවා.

මානුෂීය අවශ්‍යතා ඉටු කිරීමට යොමුවන එවැනි සංවිධානාත්මක වැඩ පිළිවෙළක් ගැන ලංකා බැලීම පහසු වූ බවක් වන්නේ නැහැ. ඒ වගේම අප කලාපයට මෙයෝ ගේ වැදගත් කරුණක් ගැන මා සඳහන් කරන්න කැමතියි. එය නම් නිවාස නැති අයට නිවාස සැපයීමේ ජාත්‍යන්තර වර්ෂයක් ප්‍රකාශයට පත් කිරීම. එක්සත් ජාතීන්ගේ මහ මණ්ඩලය විසින් 1987 වර්ෂය නිවාස නැති අයට නිවාස සැපයීමේ වර්ෂය වශයෙන් ප්‍රකාශයට පත් කර තිබෙනවා. ශ්‍රී ලංකා රජය වෙනුවෙන් ඉදිරිපත් කළ එම යෝජනාවට ගෞරවය මට හිමිවුණා.

### අරමුණ

මගේ කථාව අවසන් කිරීමට ප්‍රථම තුමුත් [illegible] ගේ සාකච්ඡා වලින් ඉටුකර ගැනීමට බලාපොරොත්තු වන ප්‍රධාන අරමුණු ගැන කරුණු කිහිපයක් සඳහන් කරන්නට කැමතියි. අප සාමාජික රටවලට සිය පාරිසරික අවශ්‍යතා සංවර්ධන අරමුණු හා ප්‍රතිපත්ති සම්බන්ධ කිරීමට උපකාර වන පැහැදිලි හා අර්ථවත් නිර්දේශ මාලාවක් ඉදිරිපත් කිරීම [illegible] ලාගේ ප්‍රධාන අරමුණ වනවා නිසැකයි. තවද, එම සාමූහික යෝජනා සඳහා අපගේ සංවර්ධ, ආකල්ප ජීවන ශෛලීන් හා සංවර්ධන රටාවල කොතරම් දුරට යන වෙනස්කම් කිරීම අවශ්‍යද යන්න හ තෝරා බේරා ගැනීමටත් මෙම ව්‍යායාමය උපකාර වනවා ඇති.

සාමාජික රටවල පාරිසරික විශයෙන් උචිත ව්‍යාපෘති වැඩ සටහන් හා ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමට එම රට විශයෙන් උචිත ව්‍යාපෘති, වල් තුළ අවශ්‍ය බව ම පව ත්වා උනන්දුවක් ඇති කිරීමත් තවත් වැදගත් අරමුණක් වනවා ඇති. මෙරට දෙන සංවර්ධනයක් සඳහා දීර්ඝකාලීන අරමුණු හා උපාය මාර්ග සකසා ගනු වස් අප අතරම අදහස් හා අත් දැකීම් හුවමාරු කර ගැනීමේ වැඩ පිළිවෙළක් ඇති කර ගැනීමත් අප විසින් සලකා බැලිය යුතුව තිබෙන ඒ හා සමානව වැදගත් අරමුණක් කියා මා සිතනවා. අදින් ජීවන ශෛලීන් මෙන්ම සංවර්ධන රටාවනුත් තීරණය සුදු යයි සංවිධානමය පදනමින් පුළුල් වශයෙන් [illegible] අදහස් පලවීමත් අප දකුණු ආසියා කලාපයේ රටවල [illegible] ඇතිය හැකි බැවින් මෙසේ වූ අදහස් හුවමාරුවක් වඩාත් අවශ්‍ය යයි මට සිතෙනවා.

### සිදුවන හානි

මෙම සමුළුවේ මුලසුන් කථාව කළ සකෙප් සංවිධානයේ සභාපති වෙළෙඳ හා නාවික කටයුතු පිළිබඳ ඇමති ලලිත් ඇතුලත්මුදලි මහතා දකුණු ආසියාවේ රටවල සංවර්ධන කටයුතු කරගෙන යද්දී පරිසරයට සිදුවන හානි ගැන සොයා බැලීම [illegible] බවත් සංවර්ධනය වෙමින් පවත්නා රට වල පුරවැසියන්ගේ ජීවන තත්ත්වය ඒ ඒ [illegible] මයින් [illegible] ඇති [illegible] පරිසරයට ඇතිවන හානි ගැන සොයා රටවල් [illegible] කල්පනා කළ යුතු බවත් කීය.

සංවර්ධන ක්‍රියාවලිය ප්‍රමාදවීමට අප විසින් දියුණු රට වලින් සිදුවී ඇති වැරදි ගැන පාඩම් උගත යුතු බවද ඇතුලත්මුදලි මහතා පැවසීය.

එක්සත් ජාතීන්ගේ සංවර්ධන අරමුදලේ සහයෝජ්‍ය විධායක අධ්‍යක්ෂ පීටර් ඈ. හැවිඩ් මහතාද සකෙප් සංවිධානයේ අධ්‍යක්ෂ මහාචාර්ය ලෙස්ලි හේරත් යන මහත්වරුද මෙහිදී කථා කළහ.

අදත් හෙටත් මෙම සමුළුව පැවැත්වේ.



කොළඹ බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ දී ඊයේ උදේ ආරම්භ වූ දකුණු ආසියා සහයෝගිතා පරිසර වැඩ සටහනේ ප්‍රථම පාලක මණ්ඩල සමුළුවට සහභාගී වූ අගමැති ආර්. ප්‍රේමදාස මහතා පාලක මණ්ඩලයේ සභාපති වෙළෙඳ ඇමති ලලිත් ඇතුලත්මුදලි මහතා ප්‍රධාන සංවිධායක විසින් රැස්වීම් ශාලාව වෙත කැඳවා ගෙන යනු ලැබූ අයුරු. අගමැතිතුමාගේ දකුණු පසින් පළාත් පාලන නිවාස සහ ඉදිකිරීම් කටයුතු නියෝජ්‍ය ඇමති පී. සී. ඉඹුලාන මහතාද වම් පසින් ලලිත් ඇතුලත්මුදලි මහතා, සහ ධීවර ඇමති පෙස්ටස් පෙරේරා මහතාද වෙති.

ඡායාරූපය — ජයන්ත දිවිසේකර

### පරිසර කාර්යාලයට ඉඩමක් තෑගි

දකුණු ආසියා සහයෝගිතා පරිසර (සකෙප්) සංවිධානයේ ප්‍රධාන කාර්යාලය පිහිටුවීම සඳහා ශ්‍රී ලංකා රජය ඉඩමක් පරිත්‍යාග කිරීමට තීරණය කර ඇත.

රජය මගින් ගෙන ඇති මෙම තීරණය අගමැතිතුමා විසින් ඊයේ එම සමුළුවට දැනුම් දෙන ලදී.